# කාර්මික නිෂ්පාදන ඇසුරුම් කිරීම

ර.යු.ඩබ්. උඩවත්ත
සහකාර අධ්‍යක්ෂ
අලෙවි අංශය

වෙළඳපොළෙහි අප මිලදීගන්නා භාණ්ඩ දවටනයක ඔතා හෝ පෙට්ටියක බහා තිබීම සාමාන්‍ය දෙයකි. අදාල භාණ්ඩය ගෘහස්ථ හෝ සුළු කර්මාන්ත ශාලාවක හෝ මහා පරිමාන කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කළද ඇසුරුමක බහා නොතිබුනහොත් එය මිලදී ගන්නන්ට අඩුවක් සේ පෙනනු ඇත. එනිසා දවටනයක එතීම හෝ පෙට්ටියක බහා තිබීම අවශ්‍යතාවයක් බවට අද පත්ව තිබෙන නර එහි වැදගත් කමක්ද ඇතිබව වැටහේ. එසේ නම් ඇසුරුම අපට වැදගත් වන්නේ ඇයි?

ඔබට ඇසුරුමක් වැදගත් වන්නේ ඔබේ නිෂ්පාදන භාණ්ඩ නිෂ්පාදිත තත්ත්වයෙන් හා පහසුවෙන් පාරිභෝගිකයාට හෝ වෙළඳපොළට සපයා, හොඳ වෙළඳපොළක් සහ වෙළඳපලේ හොඳ මිලක් ඇති කර ගැනීමටය. වෙනත් විධියකින් සඳහන් කරන්නේ නම් ඔබේ ආදායම වැඩිවීමෙන් ලාභය ඉහළ නංවා ගැනීමටයි. ඒ සඳහා අප දැනගත යුතු කරුණු බොහෝය.

## ඇසුරුම් විධි

කාර්මික නිෂ්පාදනයක් වෙළඳපොළට ඉදිරිපත් කිරීමේදී විවිධ ඇසුරුම් ක්‍රම භාවිතා වෙයි. එනිසා ඔබ නිෂ්පාදකයෙකු නම් ඔබගේ නිෂ්පාදනයට ගැලපෙන ආකාරයේ ඇසුරුම් ක්‍රමයක් පිළිබඳව ඔබ දැනගෙන සිටිය යුතු වේ. ඇසුරුම් විධි හෙවත් ඇසුරුම් ක්‍රමයක් ගැන අවධානය යොමුකරන විට ඔබේ නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කිරීමට පහත සඳහන් ක්‍රමයන් භාවිතා කළ හැකි වේ.

- දවටයක ඔතා ඉදිරිපත් කිරීම
- මලු සහ කුඩා මලු (Bags and Pouches) වල පුරවා සීල්කර ඉදිරිපත් කිරීම
- කාඩ්බෝඩ් පෙට්ටි වශයෙන්
- සම් ඇසුරුමකින්
- විනිවිද පෙනෙන සේ කාඩ්බෝඩ් සහ පොලිතින් භාවිත ඇසුරුමකින් (Blister Packaging)
- ට්‍රේස්, ටියුබ්ස් වල සහ කෝප්ප වල අසුරා
- නැවිය හැකි ටියුබ්ස් වල අසුරා
- බෝතල් වල අසුරා
- ටින් හෝ ප්ලාස්ටික් අසුරන වල අසුරා

මෙම කුමන ක්‍රමයකින් ඉදිරිපත් කරන ලද වුවද ඒ සඳහා භාවිතා කළ හැකි ද්‍රව්‍ය වශයෙන් ප්ලාස්ටික්, වීදුරු, ටින්, කඩදාසි හෝ සම් හඳුනා ගත හැකිය. කර්මාන්තකරුවකු වශයෙන් ඔබගේ නිෂ්පාදන භාණ්ඩ ඉහත සඳහන් කල පරිදි ලාභය උපරිම වන පරිදි හොඳ ඇසුරුමකින් වෙළඳපොළට ඉදිරිපත් කිරීමට ඔබට හැකියාව තිබිය යුතුය. ඒ සඳහා වඩාත් ඵලදායි ඇසුරුම් ද්‍රව්‍ය ඔබේ නිෂ්පාදන භාණ්ඩය අනුව තෝරාගත යුතුවේ. මෙම තෝරාගැනීම සඳහා ඔබට ඇසුරුම සඳහා භාවිතා වන ද්‍රව්‍ය පිළිබඳ අවබෝධයක් අවශ්‍යය. අද බහුලව භාවිතා වන ඇසුරුම් ද්‍රව්‍ය කිහිපයක් වන ප්ලාස්ටික්, වීදුරු හා ටින් ඇසුරුම් සඳහා යොදාගනහොත් එයින් ඔබට වාසි අවාසි සහ ප්‍රයෝජන ඔබ දැනගත යුතුය.

## ප්ලාස්ටික් බෝතල් හෝ බඳුන් ඇසුරුම් සඳහා යොදාගැනීමේ වාසිය

- සිත් ඇදගන්නා සුළු පෙනුම, ශක්තිමත් බව සහ ඇසුරුම කැඩුනත් ඇතුලත තිබෙන ද්‍රව්‍ය විසිරීමේ හැකියාව අඩුවීම (ප්ලාස්ටික් බඳුන කැඩුනත් වීදුරු බඳුනක් සේ කැබලි වලට වෙන් නොවේ.)
- ප්‍රවාහනයේ හා එයා මෙහා කිරීමේ පහසුව, සැහැල්ලුවීම, බර අඩු වීම
- පැහැදිලිව ඇසිරීමේ හැකියාව
- වර්ණ රාශියකින් ලබාගැනීමේ හැකියාව
- කෙටි කාලයකින් නිපදවා ගැනීමට හා ලබාගැනීමට ඇති හැකියාව
- ආර්ථිකමය වශයෙන් ලාභදායී වීම. අන් ද්‍රව්‍ය හා සැසඳීමේ මිල අඩුවීම.
- නිෂ්පාදන භාණ්ඩ අනුව හා අවශ්‍යතාවය අනුව හැඩය වෙනස් කර ගැනීමේ හැකියාව

ඇසුරුම් අමුද්‍රව්‍ය ලෙස ප්ලාස්ටික් යොදාගැනීමට, ප්ලාස්ටික් වල ඇති විශේෂ ලක්ෂණ පිළිබඳව අවබෝධයක් තිබීමද පිටුවහලක් වනු ඇත. ප්ලාස්ටික් ඇසුරුමකට යොදාගැනීමේදී පහත සඳහන් ලක්ෂණ ප්ලාස්ටික් වල ඇති බව සැලකිල්ලට ගන්න.

- රසායනික ප්‍රතික්‍රියාවලට සහභාගි නොවීම
- යාන්ත්‍රිකව ශක්තිමත් වීම
- තෙතමනය, ආර්ද්‍රතාවයට ඔරොත්තු දීම
- උෂ්ණත්වයට ප්‍රතිරෝධක බව
- ගඳ හෝ සුවඳ ඇද නොගැනීම (Odour)
- පිරිසිදුභාවය
- මතුපිට දිලිසෙන සුළු වීම (Surface Gloss)

## වීදුරු ඇසුරුම සඳහා යොදාගැනීමේ වාසි

* වීදුරු බඳුන්වල අසුරා ඇති ද්‍රව්‍ය වලට අමතර රසයක් හෝ සුවඳක් මිශ්‍ර නොවීම
* ගෑස්, සුවඳ සහ තෙතමනය වීදුරු පසාරුකරගෙන ඇතුල් විය නොහැකි වීම
* රසායනිකව ක්‍රියාකාරිත්වයකට, බලපෑමකට භාජනය නොවීම
* ජීවානුහරණය කල හැකි වීම
* ඇසුරුම් ගත ද්‍රව්‍යයෙන් ඇතිවන පීඩනයට ඔරොත්තුදීමේ හැකියාව
* ආහාර ද්‍රව්‍යයක් වුවද වීදුරු භාජනයක ඇසුරුම් කළද එම ද්‍රව්‍ය භාජනයේ ස්පර්ශ වුවත් වෙනසකට භාජනය නොවීම
* නැවත නැවත භාජනය ප්‍රයෝජනයට ගත හැකි වීම
* ඇතුලත අඩංගු ද්‍රව්‍යයට අවශ්‍යවන පරිදි වර්ණක වෙනස් කර නිපදවා ගත හැකිවීම

## ඇසුරුම් ලෙස ටින් භාවිතයේ වාසි

- ජීවානුහරණය කිරීමේදී උෂ්ණත්වයට භාජනය කිරීම මෙන්ම ඉක්මනින් ශීත කිරීමේ හැකියාවක් තිබීම
- ගර්ෂණයට ඔරොත්තු දීම, හැලහැප්පීම් වලට භාජනය වුවද අලාභයක් සිදු නොවී. ශක්තිමත් භාවයෙන් යුක්තය. බර අඩුවීම
- ජලයට, වාතයට හා හිරු එළියට ඔරොත්තු දීම
- ඇතුලත් ද්‍රව්‍ය හොඳින් පදම්කර ඇත්නම් ඇසුරුමේ ස්පර්ශ වුවද ප්‍රතික්‍රියා ඇති නොවීම
- ක්‍ෂාම සතුන්ගෙන් හා ක්ෂුද්‍ර ජීවීන්ගෙන් වන හානි වැළකීම
- නැවත භාවිතයට ගැනීම සඳහා ප්‍රතිචක්‍රීකරණය කලහැකි වීම

## වැඩි ආදායමක් ලබාගැනිම සඳහා ඇසුරුම් භාවිතා කිරීම

මුලින් සඳහන් කල පරිදි ඔබ ආයතනයේ නිෂ්පාදන සඳහා හොඳ වෙළඳපොළක් මෙන්ම වෙළඳපොළේ හොඳ මිලක් ඇතිකරගෙන වැඩි ලාභයක් ලබාගැනීම සඳහා ඇසුරුම් ක්‍රම හා ඇසුරුම් ද්‍රව්‍ය පිළිබඳ මෙන්ම ඇසුරුම් තාක්ෂණය, ඉලක්ක වෙළඳපොළ, ඇසුරුම්හි තිබිය යුතු පිරිවිතර, සැපයුම්කරුවන් ආදී කරුණු පිළිබඳව ඔබට අවධානය යොමු කිරීමට සිදුවනවා මෙන්ම එම කාරනා පිළිබඳ හොඳ දැනීමක්ද අවශ්‍ය වේ.

ඇසුරුම් ද්‍රව්‍ය සුපරීක්ෂාකාරීව ඔබගේ නිෂ්පාදන සැලැස්මට අනුව කලින් මිලදී ගැනීමෙන් අනවශ්‍ය වියදම් කපාහැර ලාභ ලබාගැනීමට හේතුවනවා ඇත. ඇතැම් විට ඔබට ඔබේ නිෂ්පාදනයට ගැළපෙන ඇසුරුමක් සකස් කිරීමට සිදුවනු ඇත. එසේ වුවහොත් ආර්ථිකමය ප්‍රතිලාභ සහිත ඵලදායි ඇසුරුමක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියට නව නිෂ්පාදනයක් සංවර්ධනය කිරීමට ගතවන කාලයට වඩා කාලයක් ගනු ඇත. එනිසා විකල්ප ඇසුරුම් පිළිබඳ පරීක්ෂණ කිරීම අත්හදා බැලීම ව්‍යාපාරය ආරම්භයේදීම කළ යුතු වේ.

## ඇසුරුම් තාක්ෂණය

ඇසුරුම් තාක්ෂණය පිළිබඳ මූලික දැනුම අඩුම වශයෙන් දැනගත යුතුවා මෙන්ම ඒ පිළිබඳ දැනීම වර්ධනය කරගතයුතුය. ඔබේ වර්තමාන ඇසුරුම් ක්‍රම සහ ඇසුරුම් ද්‍රව්‍ය පිළිබඳව ගුණ දොස් විමසා විග්‍රහකර බැලීමට, ඔබට අවශ්‍ය ශක්තිය එම දැනුම ඔබට ලබාදෙයි. අමාරුවේ නොවැටී හොඳ තත්ත්වයෙන් උසස් ඇසුරුමක් සහ ඇසුරුම් කිරීම සඳහා යන වියදම් අඩු කරන මාර්ගයක් තෝරාගැනීම සඳහා වූ තේරුම්සහගත සාකච්ඡාවක් ඔබේ ඇසුරුම් ද්‍රව්‍ය සැපයුම්කරු සමඟ සාකච්ඡා කර තීරණ ගැනීමට එම දැනුම උපකාරී කරගත හැක.

එසේම ඔබ ඔබේ සම්පූර්ණ ඇසුරුම් ක්‍රියාවලිය පිළිබඳ සවිස්තරව දැනගත යුතු වේ. ඔබේම වූ ඇසුරුම් ක්‍රියාවලිය සහ ඇසුරම් උපකරණ වල සියලූ අවශ්‍යතා පිළිබඳ පුළුල් දැනුමක් තිබීමද වැදගත් වේ.

## ඉලක්ක වෙළඳපොළ පිළිබඳ පරීක්ෂාකාරී වීම

කලින් සඳහන්කල පරිදි වැඩි ලාභ ලබාගැනීමේදී වෙළඳපොළ ආර්ථිකය තුළ ඔබේ පරිභෝගිකයා ඉතාමත් වැදගත් සාධකයකි. පාරිභෝගිකයා තෘප්තිමත් කල පමණට ඔබට ලැබෙන ප්‍රතිඵල වඩාත් ඉහළ යනු ඇත. එනිසා පළමුව ඔබේ ඉලක්ක වෙළඳපොළේ අවශ්‍යතා විමසා බලා ඇසුරුම් ද්‍රව්‍ය හෝ මුද්‍රිත ද්‍රව්‍ය ලබාගැනීමට කටයුතු කරන්න. එවිට ලේබල් හෝ ඇසුරුම් ද්‍රව්‍ය තේරීමේදී වන වැරදි වියදම් වලින් වැලකී සිටින්නට ඔබට හැකිවනු ඇත.

## තාක්ෂණික පිරිවිතර

ඔබ නිෂ්පාදන භාණ්ඩය ඇසුරුම් කිරීමේදී ඉලක්ක වෙළඳපොළ මෙන්ම ඒ අනුව සැකසෙන භාණ්ඩ පිරිවිතර වැදගත් වේ. භාණ්ඩයේ පිරිවිතර අනුව ඇසුරුමද නිර්මාණය කළයුතු අතර එය ආර්ථිකමය ප්‍රතිලාභ ලඟාකර ගැනීමේදී වැදගත් සාධකයක් වේ. ඇසුරුමෙහි නිවැරදි පිරිවිතර ස්ථාපය කර ඒ අනුව මිලදී ගැනීම් කරන විට වියදම් වැඩිවීමේ අවධානම අඩු කරයි. තත්ත්ව පාලනය වඩාත් ඵලදායි ආකාරයෙන් අනුගමනය කරන විට අපතේ යාම අඩු වේ.

## සැපයුම්කරුවෙකු තෝරාගැනීම

ඔබ ඇසුරුම් ද්‍රව්‍ය මිලට ගැනීමේදී විශ්වාසවන්ත හොඳ සැපයුම්කරුවෙකු ඔබට අවශ්‍ය පිරිවිතරයනට ඇසුරුම් ද්‍රව්‍ය සපයා ගැනීම සඳහා තෝරාගත යුතුය. ඒ සඳහා ප්‍රසිද්ධ සම්භාවනීය සැපයුම්කරුවන් සොයමින් සිටිනවිට

නියමිත ප්‍රමිතියෙන් හා මිලෙන් අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීමට හැකි නොවේ. ප්‍රසිද්ධ සැපයුම්කරුවකුට සාමාන්‍යයෙන් ආදේශක කීපයක් සැපයිය හැකිවනවා මෙන්ම හොඳ සේවයකුත් සැපයිය හැකිවේ. සාමාන්‍යයෙන් මිල අඩු භාණ්ඩ සැපයුම් කරුවන්ගෙන් ඔබට අවශ්‍ය ඇසුරුම් ද්‍රව්‍ය බෙදාහැරීම ප්‍රමාද විය හැක. එසේම තත්ත්වයෙන් බාල නොගැලපෙන භාණ්ඩ සපයනවා විය හැක. එනිසා එයින් වැලකීමට නම් සැපයුම්කරුවෙකු පිළිබඳ ඔබ දැනගෙන සිටිය යුතුය.

## ඔබේ ඇසුරුම් සපයන්නා ගැන දැනගන්න

මේ සඳහා ඔබට අනුගමනය කල යුතු කාරනා කිහිපයක් වේ. ප්‍රථමයෙන් සැපයුම්කරු සමඟ හොඳ පෞද්ගලික සම්බන්ධතාවයක් ගොඩනගා ගන්න. දෙවනුව ඔහුගේ හැකියාවන්, සීමාවන් සහ අඩුපාඩුකම් හඳුනාගන්න. ඔබගේ ඇසුරුම් පිරිවිතරවලට හා අවශ්‍යතාවයට අනුව භාණ්ඩ සපයන සැපයුම්කරුගේ යන්ත්‍ර හෝ අමුද්‍රව්‍ය මෙන්ම ඇසුරුම් ප්‍රමාණය ගැලපීම පිළිබඳ විමසිලිමත්වන්න. එසේම ඔබට ආර්ථිකමය ලාභ වැඩි වන ආකාරයට ඔබේ ඇසුරුම් වියදම් පහත හෙලීමට ඇති අවස්ථාවන් හා හැකියාවන් පිළිබඳ සැපයුම්කරු සමඟ සාකච්ඡා කරන්න. නමුත් සැපයුම්කරුගෙන් ව්‍යාපාරයේ දියුණුවට උපකාරයන් බලාපොරොත්තු නොවන්න.

## ඒකක මිල මත පමණක් ඇසුරුම් මිලදී නොගන්න

ලාභ උපරිම කිරීමේදී වියදම් අඩු කිරීමේ අටියෙන් ඇසුරුම් ද්‍රව්‍ය ඒකක මිල මත පමණක් මිලදී ගැනීමට ඔබට සිත්විය හැක. එහෙත් සමස්ත ක්‍රියාවලියේදී ඔබේ ඇසුරුම් ඒකක මිල අඩුම මිල හෝ වටිනාකම විය නොහැක. ඇසුරුමේ සම්පූර්ණ ක්‍රියාවලියම විරුද්ධව සෑම වේලාවකම මිල තිබිය හැක. ඇසුරුම් උපකරණ වල සහ ක්‍රියාවලියේ අඩු නිෂ්පාදකතාවය නිසා මිලෙහි විශාල වෙනසක් ලෙහෙසියෙන් සිදුවිය හැක.

## වියදම් අඩුකර ගැනීම සඳහා තවදුරටත් ගතයුතු ක්‍රියාමාර්ග

ඔබට ඇසුරුම් සකස් කර ගන්නේ නම් ඔබට තවත් බොහෝ දෙ සිතන්නට හා කරන්නට සිදුවේ. එනිසා පහත සඳහන් කරුණු පිළිබඳවද අවධානය යොමු කරන්න.

- අමුද්‍රව්‍ය කිලෝවක් (යම් තෝරාගත් ප්‍රමාණයක්) උපරිම ඇසුරුම් ප්‍රමාණයක් ලබාගැනීමට සැළසුම් කරන්න.
- හොඳින් ගැලපෙන ඇසුරුම පිරිවැසුම්දායකය.
- නිෂ්පාදිත භාණ්ඩය සමහරවිට හකුලා අඩු ඇසුරුම් ද්‍රව්‍ය ප්‍රමාණයන් යන ආකාරයෙන් ඇසුරුම් කල හැකිවේ.
- ඇසුරුම්ගත කරන අවස්ථාවේදී ඇසුරුම සෙලවීමෙන් මෘදු භාණ්ඩ වැඩිපුර දැමිය හැකි වේ.
- විවිධ ප්‍රමාණයේ භාණ්ඩ ඇසුරුම් කිරීමේදී එකම ප්‍රමාණයේ භාණ්ඩ එකට ඇසිරීමට උත්සාහ ගන්න.
- ඔබේ නිස්පාදන ක්‍රියාවලියේ විවිධ ප්‍රමාණයේ භාණ්ඩ නිෂ්පාදනයට අඩු කිරීමට කටයුතු කරන්න.
- විශාල ප්‍රමාණයේ ඇසුරුම් භාවිතයෙන් වලකින්න.
- ඇසුරුමේ විවිධ වර්ණයන්ගෙන් මුද්‍රණ කිරීම අඩු කරන්න.
- ආදේශක ඇසුරුම් ක්‍රම හා ඇසුරුම් ද්‍රව්‍ය පිළිබඳව සොයන්න.
- විවිධ වැඩ කල හැකි ඇසුරුම් උපකරණ මිලදී ගන්න.
- අනවශ්‍ය අපතේ යෑම් වැලැක්වීම සඳහා සියළු නිෂ්පාදන ක්‍රියාවලින් පරීක්ෂා කරන්න.
- ආරම්භයේදී වන අපතේ යෑම් අවම කරන්න.
- උපකරණ නිසි පරිදි නඩත්තු කරන්න.
- අර්ධ ස්වයංක්‍රීය හෝ ස්වයංක්‍රීය පිරවුම් සහ වැසුම් උපකරණ හඳුන්වා දෙන්න.
- අභ්‍යන්තර එහා මෙහා ගෙන යාමේ ක්‍රම සහ විධි වැඩිදියුණු කරන්න.
- ගබඩාවේ තත්ත්වයන් වැඩිදියුණු කරන්න.

මූලාශ්‍ර: Food Packeging, Technology Hand Book
National Institute of Industrial Research INDIA

Packeging is Marketing - Leonard M. Guss